# බුදුදහම සහ ව්‍යවස්ථාව

## පසුබිම

ශ්‍රී ලංකාවේ නව ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාදාමය ආශ්‍රිත ව ඉදිරිපත් වූ විවාදාත්මක මාතෘකාවක් වූයේ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව තුළ බුදුදහම සම්බන්ධයෙන් තිබිය යුතු ස්ථානය යි. මහජන අදහස් විමසීම් කමිටුවේ ආගම පිළිබඳ අතුරු කමිටුවේ සාමාජිකයන් අතරින් ඇතමෙක් ඉදිරිපත් කර තිබූ යෝජනාවන් මෙම විවාදය ඇතිකරවීමට හේතු විය. කෙසේනමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටු අතුරු වාර්තාව නම් යෝජනා කරන්නේ පවතින වගන්තිය එලෙස ම තබා ගැනීමට හෝ මුල් වගන්තිය බුදුදහම සම්බන්ධ ප්‍රතිපාදන එලෙස ම ඇතුළත් විකල්ප සූත්‍රණයක් පිළිබඳ ව සලකා බැලීමටත් ය.

## අනාගමිකත්වය

අනාගමිකත්වය යන්න නිශ්චිත එක් නිර්වචනයකින් දැක්විය නොහැකි සංකල්පයකි. එයට හේතුව වන්නේ අනාගමික රාජ්‍ය සංකල්පය තුල ම විවිධ ආකෘති පැවතීම ය. රාජ්‍ය සහ ආගම එකිනෙකින් වෙන්කර තැබිය යුතු ය යන්න අනාගමික රාජ්‍ය සංකල්පයේ හරය ලෙස සරළ ව දැක්විය හැකි ය. ඒ තුළ රජය කිසිදු නිශ්චිත ආගමික සංකල්පයකට අනුගත වීමෙන් බැහැර ව ලෞකික අරමුණු කරා යොමුවීම, ආගමික සංකල්ප පදනම් කරගත් (ෂරියා සහ හලකා) වැනි නීති පද්ධති බැහැර කිරිම සහ කිසිදු නිශ්චිත ආගමක් රාජ්‍යයේ නිළ ආගමක් ලෙස පිළිනොගමින් සියලු ආගම් කෙරෙහි සමාන ව කටයුතු කිරීම සිදුවේ.[1]

ඇතැම් විද්වතුන් පවසන පරිදි අනාගමිකත්වය විසින් මුළුමනින් ම රජය ආගම් සමග ඇති සබඳතාවය අත්හැරීමක් අදහස් නොවෙයි. ඔවුන් පවසන පරිදි අනාගමිකත්වය තුළ දැඩි සහ ලිහිල් ස්වරූපයක් හඳුනා ගත හැකි ය. ජැක්විස් බර්ලිනර්බ්ලවු තර්ක කරන පරිදි රජය සහ ආගම පූර්ණ වසයෙන් වෙන්කර තැබීම අනාගමිකත්වය තුළ යොදාගැනෙන එක් උපක්‍රමයක් විනා අනිවාර්යතාවයක් නොවේ. රාජ්‍ය සහ ආගම අතර බැදියාව (දැඩි) අනාගමික රාජ්‍යයන් තුළ පවා දැකිය හැකි තත්ත්වයක් බවත් සැම අනාගමික රජයක් ම තමන්ට ම සුවිශේෂී ක්‍රමවේද ආගමික නැඹුරුවන්ගෙන් ලෞකික රාජ්‍යය ආරක්ෂා කිරීමට යොදා ගන්නා බවත් හෙතෙම පවසයි. නිදසුනක් ලෙස අනාගමික රාජ්‍යයක් වන ප්‍රංශයේ පල්ලිය යම් ප්‍රමාණයකට පරිපාලනය කිරීම රජය විසින් සිදු වේ.[2] මේ අරුතින් ගත්විට වත්මන් නමවන වගන්තිය ශ්‍රී ලංකාව අනාගමික රාජ්‍යයක් වීමෙන් වළක්වන්නේ නැත. (නමුත් මේ තත්ත්වය අනාගමික තර්කය ඉදිරිපත් කරන බොහෝ වියතුන්ගේ අවධානයට ලක් වී නැත.) ශ්‍රේෂ්ඨාධිකරණයද අවස්ථා දෙකක දී ම තීන්දු කර ඇත්තේ ශ්‍රී ලංකාව අනාගමික රාජ්‍යයක් බව ය. ශ්‍රී ලංකා ගාඩියන් විසින් පළකරන ලද What should be the State Religion of Sri lanka මැයෙන් ලියන ලද ලිපිය කියවීමෙන් රාජ්‍ය ආගමක් පැවතීම කිසිදු මූලික අයිතිවාසිකම් පිලිබඳ ප්‍රකාශනයකට පටහැනි නොවන අන්දම වටහා ගත හැකි ය.

Moderate Secualarism: Respect for Religion and Religion as Identity නම් ලියවිල්ලේ තාරික් මුදූද් පෙන්වාදෙන්නේ රාජ්‍ය-ආගමික සබඳතාවය ව්‍යවස්ථාමය ලෙස අහෝසි කිරීමකින් තොර ව ලිහිල් ලෙස පවත්වාගැනීමෙන් බහුසංස්කෘතික සමානාත්මතාවයක් කරා යා හැකි බව බ්‍රිතාන්‍ය අත්දැකීම විසින් පෙන්වා දී ඇති බවයි.[3] මහරැජින සිය නත්තල් දින විකාශයේ දී අනාගමික සිද්ධස්ථාන කරා සුහදතාවය පිණිස ගමන් කිරීම, චාල්ස් කුමරු රාජ්‍යාගමේ ආරක්ෂකයා යන ඓතිහාසික අභිදානයට වඩා (පොදුවේ) ආගම් ආරක්ෂා කිරීමේ වගකීම දරන්නා යන අභිදානය භාවිතයට කැමති බව පැවසීම මෙන් ම බ්‍රිතාන්‍ය රජය උපදේශක සභා/මණ්ඩළ ආදිය පත්කිරීමේ දී බහුආගමික පදනමක් මත නියෝජිතයන් පත්කිරීම වැනි ක්‍රියාමාර්ග නිදසුන් ලෙස දක්වන ඔහු මෙසේ පවසයි.

---

1 https://en.wikipedia.org/wiki/Secularism
2 https://en.wikipedia.org/wiki/Secularism
3 The Political Quarterly, Vol. 81, No. 1, January–March 2010
DOI: 10.1111/j.1467-923X.2010.02075.x

> ඉස්මතු වෙමින් පවතින බහු ආගමික තත්ත්වයට මුහුණදීමේ දී වේවා, වෙනස්කම්වලට ලක් වූ ආගම් හා නිකායන් සුරක්ෂිත කිරීමට සහ ඇතැම් ආගම් ආගම්වල වරප්‍රසාදිත තත්ත්වයට අභියෝග කිරීමේ දේශපාලනික ප්‍රයත්නයන්හි දී වේවා සමාජ පරිසරය පිලිබඳ සංවේදී වූත් සාම්ප්‍රදායිකවාදී වූත් ප්‍රතිචාරයක් විසින් සිදුවන්නේ රාජ්‍ය සහ ආගම අතර සබඳතාවය නුසුදුසු ලෙස වැඩිදියුණු කිරීමට වඩා බහුසංස්කෘතිකත්වය කෙරෙහි වඩාත් සුහදායක තත්ත්වයන් කරා ගෙන යාමයි. ඇත්තෙන් ම වාමාංශික දක්ෂිණාංශික දෙපිරිසේ ම, වෙසෙසින් ම රැඩිකල් අනාගමිකවාදීන්ගේ සහ ඉස්ලාම්භීතික ජනප්‍රියවාදීන්ගේ විවේචන නොතකමින් බටහිර යුරෝපයේ බොහොමයක් රටවල සිදුවන්නේ මෙයයි.[4]

ආගම පිළිබඳ අතුරු කමිටුවට අනාගමික වීමේ යෝජනාව ඉදිරිපත් කළ අයෙකු වන ආචාර්ය කුමුදු කුසුම් කුමාර පවසන්නේ[5] අනාගමික රාජ්‍යක් යනු ආගම බැහැර කරන රාජ්‍යයක් නොවන බව ය. ඔහු පවසන පරිදි බුදුදහමට ඇති රාජ්‍යානුග්‍රහය ඔහු අදහස් කරන ලද ආකාරයේ අනාගමිකත්වය තුළ ඉවත් නොවේ.

අනාගමික රාජ්‍යක් රටක සුලුතර ආගමික සහ වාර්ගික කණ්ඩායම්වල සුරක්ෂිතතාවය බෙහෙවින් තහවුරු කරන බව ඇතැම් විද්වතුන් පවසන අතර සමහරුන් පවසන්නේ රාජ්‍යයක් අනාගමික වීම නිසා ම එය එසේ සිදු නොවන බව ය. නිදසුනක් ලෙස රාජ්‍යයක් නීතිමය වසයෙන් අනාගමික වුවත් සමාජය තුළ මහජාතිකවාදය පැතිර පවත්නේ නම් එය දේශපාලනය තුළත් දෘෂ්‍යමාන විය හැකි බව ය. ඒ හේතුවෙන් සමාජය වෙනස් නොවන තාක් රාජ්‍යය අනාගමික වීම විසින් පමණක් සමාජයක බහුතරවාදයන් යටපත් නොවන බව ය.

අනාගමිකත්වය නිශ්චිත ඓතිහාසික තත්ත්වයක පල්ලියේ දැඩි මර්දනකාරී ස්වරූපය නිසා යුරෝපීය සමාජය තුළ ඇති වූවක් මිස මෙරටට සුදුසු සංකල්පයක් නොවන බවටද සමහරු කරුණු දක්වති.

## <u>ආගමික නිදහසට සහ සහජීවනයට සෘජු බාධාවක් ඇත් ද?</u>

වැලිකල සහ ස්කොන්තාල්[6] පවසන පරිදි නමවන වගන්තියේ ක්‍රියාකාරීත්වය මෙතෙක් කල් රඳා පැවතී ඇත්තේ අධිකරණයේ අර්ථ නිරූපණ බලය මත ය. එයට හේතුව මෙහි අර්ථය සහ විෂය සීමාව ඉතා  අවිනිශ්චිත වීම ය. මේ දක්වා අධිකරණය තුළින් මේ ව්‍යවස්ථාවේ සහාය පතමින් ඉදිරිපත් වූ ඉල්ලීම් වර්ග දෙකකි.

එකක් බුද්ධ ශාසනයේ අභ්‍යන්තර කටයුතු උදෙසා මැදිහත් වීම රජයේ වගකීමක් බව පවසමින් ඉදිරිපත් වූ ඒවා ය. මෙවැනි නඩු බොහෝ විට භික්ෂූන් විනයට පටහැනි යම් අවස්ථාවක් ලබා ගැනීමෙන් වළක්වන ලෙස ඉල්ලමින් ඉදිරිපත් වී ඇත. භික්ෂුවක් රියදුරු බලපතක් ලබා ගැනීම භික්ෂු විනය බිඳ දමන්නක් හෙයින් බුදුදහම රැකීමට රජය කැප වී ඇති බැවින් එය වළක්වන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටිනු ලැබූ නාකුලගම සුමන හිමි සම්බන්ධ සිද්ධියත් භික්ෂුවක් නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීම වළක්වන ලෙස ඉදිරිපත් වූ නඩුවකුත් මේ ගණයට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

අනෙක වන්නේ බුදුදහම බාහිර සාධකවලින් හෝ අන්‍යාගමික තර්ජනවලින් ආරක්ෂා කිරීමට රජය මැදිහත් විය යුතු බව පවසමින් ඉදිරිපත් වූ ඒවා ය. බොහෝවිට බෞද්ධ පුදබිම් සහ පරිසරයන් සුරක්ෂිත කිරීමට රජය මැදිහත් විය යුතු බව පවසමින් මේ ඉදිරිපත් වී ඇත. ප්‍රබල නිදසුනක් වන්නේ සුනාමියෙන් අවතැන් වූ මුස්ලිම් ජනතාව වෙනුවෙන් කළ නිවාස ව්‍යාපෘතියක් සේරුවිල පුදබිමට ඉතාමත් ආසන්නයේ පිහිටි බැවින් එය එහි බෞද්ධ පසුබිමට තර්ජනයක් බව පවසමින් ඉදිරිපත් වූ නඩුවකි. එහි දී ඉදිරිපත් වූ තර්කය වූයේ භික්ෂූන්ගේ පිණ්ඩපාතය සොයාගැනීම වැනි කටයුතුවලට  ඒ ආසන්නයේ ම මුස්ලිම් ජනාවාසයක් තිබීම බාධාවක් විය හැකි බව යි.

---

4 The Political Quarterly, Vol. 81, No. 1, January–March 2010
DOI: 10.1111/j.1467-923X.2010.02075.x

5 https://www.colombotelegraph.com/index.php/2016/09/

6 Schonthal, B.,and Welikala, A., ‘Buddhism and the regulation of religion in the new constitution:Past debates, present challenges, and future options’, CPA Working Papers on Constitutional Reform, No 3, July 2016 (www.cpalanka.org)

නමුත් මේ සෑම අවස්ථාවක ම අධිකරණය මේ වගන්තිය අර්ථ නිරූපණය කර ඇත්තේ ඉතාමත් ප්‍රවේශමෙනි.[7]

## ආගමික නිදහසට සහ සහජීවනයට වක්‍ර බලපෑමක් ඇත් ද?

මෙම වගන්තිය ප්‍රායෝගික බලපෑමක් නොකළත් සමාජ මතය කෙරෙහි බලපෑ හැකි ය. විශේෂයෙන් ම මෙය සිංහල-බෞද්ධ මහජාතිකවාදයට කොළ එළියක් බව ඇතැම් විකල්ප ක්‍රියාකාරිකයන්ගේ මතයයි. ඔවුන් පවසන්නේ මෙය ද ඇතුලු ව ජාතික ධජයේ සංකේත භාවිතය සහ නියෝජනය වැනි තවත් බොහෝ සංකේතනයන් කාලීන ව ඇති වූ වාර්ගික ප්‍රචණ්ඩත්වයන්ට මූලික හේතුව වසයෙන් හඳුනා ගත හැකි සිංහල-බෞද්ධ මහජාතිකවාදය සුපෝෂණය කරන බව යි.

අනෙක් අතට මෙය සහෝදර ආගමික සහ වාර්ගික පිරිස් ශ්‍රී ලාංකික අනන්‍යතාවයෙන් පරාරෝපණය කිරීමටද ඉඩ ඇත. පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්තිරන් මහතා මෙසේ පවසයි.

> *අප ඉතා පැහැදිලිව ශ්‍රී ලංකාව අනාගමික රාජ්‍යයක් විය යුතු බවට ප්‍රකාශ කර ඇති අතර මම මෙය වගකීමෙන් යුතුව කියමි: සියලු පුරවැසියන්ට සමානව සැලකීමට සොයන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අනාගමික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් විය යුතුය. මම බෞද්ධයෙක් නොවෙයි. කාටවත් මට කියන්න බැහැ මම මේ රටේ දෙවන පන්තිය කියා. එක ආගමකට පමණක් ප්‍රමුඛ ස්ථානයක් ලබා දෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සියලු පුරවැසියන්ට සමානත්වයෙන් සලකන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් විය නොහැක. සියලු පුරවැසියන්ට එක සමානව සලකන්නේ නැති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යද නැද්ද යන්න තීරණය කිරීම දැන් මෙම සභාවට භාරයි. එය එසේ අවශ්‍යයි තීරණය කරත් අපි අපේ අදහස තව දුරටත් පවසා සිටිනවා. නමුත් බෞද්ධ ජනතාව බෞද්ධ ආගමට යම් නිශ්චිත තත්වයක් ලබා දිය යුතු යයි සිතන්නේ නම් අපි එයට බාධා කරන්නේ නැත.*
>
> *නමුත් එය බෞද්ධයන් විසින් ගන්න ඉතා අසාධාරණ තීරණයකි. බෞද්ධයන් නොවන අප, ප්‍රමුඛ ස්ථානයක් ලබා දීම ගැටළුවක් කරගන්නේ නැත. නමුත් බෞද්ධයන් කෙසේද කියන්නේ බුද්ධාගමට ප්‍රමුඛ ස්ථානය ලබා දිය යුතු බවත් අන් ආගම් වලට වෙනත් ස්ථානයක් ලබා දිය යුතු බවත්? සාමානාත්මතාවය වෙනුවෙන් නැගී සිටින බෞද්ධයෙක් කෙසේද මෙවැනි අදහසක් පවසන්නේ? නමුත් තවමත් ඔබට එය අවශ්‍ය නම් අපි එය ඔබට ලබා දෙන්න කැමති.*[8]

2016 වසරේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදුකළ සමීක්ෂණයකට අනුව සිංහල ජනගහණයෙන් 70.4%ක් දැඩි ප්‍රසාදය පළකරද්දී අනිකුත් ප්‍රජාවන්ගෙන් බහුතරයක් (දෙමල – 75.9%, උඩරට දෙමල – 56.6%, මුස්ලිම් - 62.8%) මෙම වගන්තිය නව ව්‍යවස්ථාවට ඇතුළත් වනු දැකීමට කැමැත්තක් දක්වා නොතිබුණි. දැඩි ප්‍රසාදය පළකර තිබුණු පිරිස සමස්ත ශ්‍රී ලාංකික ජනගහණයෙන් 54.9%ක් විය. සැමට ආගමික නිදහස ඇතිකිරීම සම්බන්ධයෙන් විනා ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව තුළ ආගම සම්බන්ධ ව කිසිදු සදහනක් නොතිබිය යුතු ය යන ප්‍රකාශයට කැමැත්ත දක්වා තිබුණේද ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහණයෙන් 6.3%ක් පමණි.[9]

---

7 Schonthal, B.,and Welikala, A., 'Buddhism and the regulation of religion in the new constitution:Past debates, present challenges, and future options', CPA Working Papers on Constitutional Reform, No 3, July 2016 (www.cpalanka.org)

8 ආණ්ඩුක‍්‍රම ව්‍යවස්ථා මණ්ඩලය: නිල වාර්තාව, 2017 ඔක්තෝබර් 30 වන සඳුදා, 1 වන කාණ්ඩය - 6 වන කලාපය

9 Opinion Poll on Constitutional Reform: *Top Line Report*, February 2016, (Colombo: Centre for Policy Alternatives), p. 9. Available Online: http://www.cpalanka.org/wp-content/uploads/2016/02/Opinion-Poll-on-Constitutional-Reform.pdf

## බුදුදහම කෙරෙහි ඇති බලපෑම කෙබඳුද?

මෙම වගන්තිය සංශෝධනය කිරීමට ගන්නා සෑම ප්‍රයත්නයක් ම මාධ්‍ය, මහජනතාව සහ දේශපාලකයන් ඇතුලු බොහෝ පිරිස් විසින් වටහා ගනු ලැබුවේ බුදුදහමට ඇති තත්ත්වය අහිමි කිරීමක් ලෙස ය.

නමුත් Buddhism and the regulation of religion in the new constitution: Past debates, present challenges, and future options නමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පළකර ඇති පර්යේෂණ පත්‍රිකාවේ වැලිකල සහ ස්කොන්තාල් මෙම වගන්තිය සම්බන්ධ ව සිත්ගන්නාසුලු කරුණු කීපයක් හඳුනා ගනියි.

- මෙම වගන්තිය පිළිබඳ ආරම්භයේ පටන් ම බෞද්ධ ජනතාව තුළ ම මතභේද පැවතී ඇත. වෙසෙසින් ම බුදුදහමේ ස්වාධීනත්වය රජයේ බලපෑමෙන් ආරක්ෂා කිරීමත් බුදුදහමේ අභ්‍යන්තර විනය ආරක්ෂා කිරීමත් යන එකිනෙක ගැටෙන අවශ්‍යතාවයන් දෙකකට මැදි වීමට සිදු වේ. මේ තත්ත්වය සංඝ කතිකාවත් පනත පිළිබඳ විවාදයේ දී මනා ව පිලිබිඹු වූවකි.

- මෙම වගන්තියේ බුදුදහම ආරක්ෂා කිරීම යන්නේ අරුත කෙරෙහි පවතින විවාදාත්මක තත්ත්වය බෞද්ධ භික්ෂූන් සහ ගිහිජනයා අතර ගැටුම්කාරී තත්ත්වයක් ඇති කිරීමටද හේතු වී ඇත. අවස්ථා කීපයක දී ම භික්ෂු විනයට පටහැනි යැයි ඇතැම් වෘත්තීන් හෝ වෙනයම් අවස්ථාවන් (රියදුරු බලපත්) ලබාගැනීමෙන් භික්ෂූන් ව වළක්වන ලෙස ගිහියන් විසින් මේ ව්‍යවස්ථාව යටතේ අධිකරණයෙන් ඉල්ලීම් කර ඇත.

- එමෙන් ම බුදුදහම සුරක්ෂිත කිරීම යන්න බුදුදහමට බලපෑමක් නොමැති විවිධ සමාජ විපර්යාසයන් ද බුදුදහමට තර්ජනයන් ලෙස අනවශ්‍ය ලෙස දක්වමින් බෞද්ධයන් අතර නොසන්සුන්කාරී තත්ත්වයන් ඇතිකිරීමට සහ සහජීවනය සම්බන්ධයෙන් අහිතකර තත්ත්වයක් ඇති කිරීමටද තුඩු දෙයි.

## නීතිමය වසයෙන් ගැටුම්කාරී තත්ත්වයක් ඇත් ද?

ස්කොන්තාල් පෙන්වා දෙන සුවිශේෂී කරුණක්ද සඳහන් කළ යුතු ය. එනම් මෙහි මූලබීජයන් රෝපණය වූයේ සෝල්බරි ව්‍යවස්ථාවේ 29(2) වගන්තියට ප්‍රතිචාරයක් ලෙසින් වූ අතර එය ප්‍රතිවිරුද්ධ තර්ක දෙකක් පදනම් කරගනිමින් එල්ල විය. සෝල්බරි ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනය ප්‍රමාණවත් සුරක්ෂිතතාවයක් සුලුජනයින්ට ඇති නොකරන බවට දමිළ දේශපාලකයන් (ජී. ජී. පොන්නම්බලම්) වෙතින් තර්කයන් ඉදිරිපත් වූ අතර යටත්විජිත සමය තුළ බුදුදහමට එරෙහි ව සිදු වූ වැරදි නිවැරදි කළ යුතු බවට (ගුණපාල මලලසේකර විසින්) සහ බුදුදහමට අතීතයේ පැවති තත්වය යළි ලබාදිය යුතු බවට (ජේ. ආර් ජයවර්ධන විසින්) ගෙනෙන ලද ඉල්ලීම් මත එහි අවසන් හැඩය තීරණය විය. ඒ අනුව එය විවිධ පාර්ශ්වයන්හි මෙන් ම ප්‍රතිවිරුද්ධ අවශ්‍යතාවන් දරාසිටින වගන්තියක් වසයෙන් ආගමික සමානත්වය කෙරෙහි නොපැහැදිලි සහ උභයාවේගී දෘෂ්ටියක් (භාෂාවක්) දරයි.

කොල්වින් ආර්. ද සිල්වා මහතා ඔහු පෙනී සිටියේ සහ මුලින් ම ඉදිරිපත් කරනු ලැබුවේ අනාගමික ව්‍යවස්ථාවක් වුවත් එකළ පැවති සමාජ බලවේගයට අවනත වීමට සිදුවිය. මෙවැනි උභයාවේගී භාෂාවක් භාවිත කිරීම විසින් මෙම ප්‍රතිවිරුද්ධ අවශ්‍යතාවයන් දෙක ම සංතෘප්ත කළ හැකි වනු ඇතැ යි ඔහු කල්පනා කරන්නට ඇති බව ස්කොන්තාල් පවසයි. කෙසේනමුත් මේ අවිනිශ්චිතභාවය ම විවිධ අර්ථකථනයන්ට සහ නොසන්සුන්කාරී වටපිටාවන්ට මගපෑදීමටත් හැකි ය.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ දී ෆෙඩරල් පක්ෂය ඉදිරිපත් කළ යෝජනාවන් තුළ මෙහි නෛතිකමය වසයෙන් ගැටලුකාරී ස්වභාවය පිලිබඳවද ප්‍රබල තර්කයන් දක්වා තිබී ඇත. එනම් මෙහි වාසි ලබන්නන් කවුරුන්ද යනු නිශ්චිත නොවන බව යි. ඔවුන් බෞද්ධයන් නම් එය ම අනිකුත් මූලික

අයිතිවාසිකම්වලින් සපයා ඇති සමානත්වය උල්ලංඝනය කිරීමකි.[10] (තාර්කි මුදුද්ගේ වචන මීට පිළිතුරු ලෙස දැක්විය හැකි ය.)

## සැලකිය යුතු කරුණු

වත්මන් නමවන වගන්තිය මූලික කරුණු දෙකක් අවධාරණය කරයි.

1. රජය බුදුදහමට ප්‍රමුඛස්ථානය දිය යුතු ය.
2. රජය බුදුදහම සුරක්ෂිත කර පෝෂණය කළ යුතු ය.

මින් පළමුවැන්න හුදු සංකේතීය වටිනාකමකින් පමණක් සමන්විත වන අතර ඉන් ඇත්තේ ජනමතය කෙරෙහි වන මනෝවිද්‍යාත්මක බලපෑමක් පමණි. එම බලපෑම සිංහල ප්‍රජාව කෙරෙහි ධනාත්මකවත් අනෙකුත් ප්‍රජාවන් කෙරෙහි සෘණාත්මකවත් ක්‍රියාත්මක වේ. දෙවැන්න (විශේෂයෙන් ඉහත කී දෙවන ගණය යටතේ ඉදිරිපත් වූ නඩු දෙස බලන විට) සුළුතර ආගමික හා වාර්ගික කණ්ඩායම්වල අයිතිවාසිකම්වලට එරෙහිව ඉදිරිපත් කළ හැකි බව පෙනේ. වැලිකල පවසන පරිදි මෑත යුගයක මේ දෙවන ගණයේ නඩුවල වැඩිවීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. එමෙන් ම මෙය බුද්ධ ශාසනය සම්බන්ධයෙන්ද ගැටලුකාරී තත්ත්වයක් ඇති කරයි. ඒ අනුව මෙහි කිසියම් ආකාරයක වෙනසක් සිදුකිරීම බෙහෙවින් ම ප්‍රයෝජනවත් වන්නකි. අනෙක් අතට එය හුදෙක් බෞද්ධ අනන්‍යතාවයට එරෙහි ව සහෝදර ආගමික/වාර්ගික පිරිස්වල අයිතීන් වෙනුවෙන් ම ගන්නා පියවරක් ලෙසද වටහා ගත යුතු නොවේ. බුද්ධ ශාසනය සම්බන්ධයෙන් ඇතිවන ගැටලුකාරී තත්ත්වය අවම කිරීමද කළ යුතු වෙයි.

මෙහි දී අප හඳුනාගත් ගැටලු දෙකක් වෙයි. එකක් අන්‍යාගම් කෙරෙහි සුරක්ෂිත සහ අභිමානවත් තත්ත්වයක් ඇති කිරීමයි. අනෙක නම් බුද්ධශාසනය සුරක්ෂිත කිරීමේ ප්‍රතිපාදනයෙන් භික්ෂු ස්වාධීනත්වය ආරක්ෂා වන පරිදි කටයුතු යෙදීමයි. සැබවින් ම මෙම අවශ්‍යතාවයන් දෙක ම තෘප්ත කිරීමට කටයුතු කිරීම තුළ පෙර කී පරිදි ම උභයාවේගී ස්ථාවරයක් දැරීමට සිදුවනු ඇත. එය ජයගැනීම පිළිබඳ කාරණය විෂය පථයෙන් බැහැර යන්නක් බැවින් මෙම එකිනෙක අරමුණු උදෙසා ගත හැකි පියවර වෙන ම සාකච්ඡා කරමු.

## අන්‍යාගම් කෙරෙහි සුරක්ෂිතතාවය ඇති කිරීම

මෙහි දී එකිනෙක ගැටිය හැකි අරමුණු දෙකක් තෘප්ති කිරීමට සිදුවන බවක් පෙනී යයි. එකක් බුදුදහම කෙරෙහි ශ්‍රී ලංකාවේ ඓතිහාසික ව සහ සමාජයීය ව ඇති තත්ත්වයට යම් වටිනාකමක් ලබා දීම ය. අනෙක නම් අනෙකුත් ආගම් කෙරෙහි සුරක්ෂිතතාවය ශක්තිමත් කරමින් ඔවුන්ගේ අනන්‍යතාවය කෙරෙහිද අභිමානවත් තත්ත්වයක් ඇතිකිරීම ය. මේ අරමුණු දෙක ම ආමන්ත්‍රණය නොකරන කිසිදු විසඳුමක් සමාජය අනුමත නොකරනු ඇති සේ ම ඵලදායකද නොවනු ඇත. ලංකාවේ බහුතර ජනතාවකගේ අනුමැතිය ලැබීමට (වෙනස් කළ හැක්කේ ජනමත විචාරණයකින් පමණක් බැවින්) නම් පළමු අවශ්‍යතාවය තෘප්ත කළ යුතු ම ය. (අනෙකුත් වාර්ගික ප්‍රජාවන්ගේ සහ විකල්ප මත කෙරෙහි නැඹුරු බෞද්ධ පිරිස්වලද ඡන්දයෙන් එවැන්නක් ජයග්‍රහණය කළ හැකි වුවත් එය ආන්දෝලනයකට තුඩු දිය හැකි ය.) නමුත් එය තෘප්ත කිරීමට ගන්නා උත්සාහය ම ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට මෙන් ම අධිපතිවාදී චින්තනයට ඇති අනුග්‍රහය අවම කිරීමටද ඉවහල් වන දෙවන අවශ්‍යතාවය ව්‍යර්ථ කිරීමට ඉඩ ඇත.

නමුත් මෙම ව්‍යවස්ථාව පොදු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ඇතිවීම කෙරෙහි අහිතකර ලෙස බලපාන බවද හඳුනා ගතිමු. බහුතරයක් සිංහල-බෞද්ධ ජනතාව මෙම වගන්තිය ඉවත් වනු දැකීමට කැමති නොවන බවද අපි වටහා ගතිමු. ඒ අනුව මෙම ව්‍යවස්ථාව මුළුමනින් ම ඉවත් කිරීමකට හෝ බුදුදහම සම්බන්ධ ව ඇති සඳහන් කිරීම කැපී පෙනෙන ලෙස/මුළුමනින් ම ඉවත් කිරීමට වඩා යෝග්‍ය වන්නේ සෑම ආගමකට ම සුරක්ෂිතතාවය සහ අභිමානය වඩාත් තහවුරු වන, එම ආගම් අදහන පිරිස්වලට

10 Schonthal, B.,and Welikala, A., 'Buddhism and the regulation of religion in the new constitution:Past debates, present challenges, and future options', CPA Working Papers on Constitutional Reform, No 3, July 2016 (www.cpalanka.org)

වඩාත් සුරක්ෂිත සහ අභිමානවත් හැඟීමක් දැනෙන භාෂාවකින් ප්‍රතිස්ථාපනය කිරීමයි. මේ පිණිස ගත් ආදර්ශවත් නිදසුන් කීපයක් ම අප හමුවේ ඇත.

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටු අතුරු වාර්තාවේ විකල්ප සූත්‍රණය</u>

දැනට පවතින ව්‍යවස්ථාව පහත පරිදි වේ.

> *ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිතකොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.*

යෝජිත සූත්‍රණය පහත පරිදි ය.

> *ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් සියලු ආගම් හා විශ්වාසයන්ට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකමින් හා වෙන්කොට සැලකීමකින් තොර ව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලු ම පුද්ගලයන්ට සහතික කරමින්, බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය.*

මෙහි ශ්‍රී ලංකා ජනරජය යන්න ශ්‍රී ලංකාව ලෙස වෙනස් කර ඇති අතර එය එම වාර්තාව විසින් මෙම ව්‍යවස්ථාවට පමණක් කර ඇති වෙනසක් නොවේ. මෙම ව්‍යවස්ථාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය යන්න හෝ බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කළ යුතු ය යන්න හෝ ඉවත් කර හෝ වෙනස් කර නැත. නමුත් ඒ වෙනුවට ඔවුන් අන් ආගම්වල අයිතිවාසිකම්ද ආරක්ෂා විය යුතු බව පවසන වැකියට, *සියලු ආගම් ආගම් හා විශ්වාසයන්ට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකමින් හා වෙන්කොට සැලකීමකින් තොර ව* යනුවෙන් එකතු කිරීමක් කරයි. තවද වත්මන් ව්‍යවස්ථාවේ 10 සහ 14(1) (ඉ) ව්‍යවස්ථාවන්ට කේන්ද්‍රගත වෙමින් අනිකුත් ආගම්වල අයිතිවාසිකම් සුරක්ෂිත කරද්දී ඒ වෙනුවට නව සූත්‍රණය තුළ *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලු ම පුද්ගලයන්ට සහතික කරමින්* යනුවෙන් දක්වයි.

මෙම භාෂාත්මක වෙනස තුළින් සහෝදර ආගම් කෙරෙහි වැඩි සුරක්ෂිතතාවයක් සහ අභිමානයක් ඇති කිරීමට දරා ඇති උත්සාහය අප අගය කළ යුතු ය.

<u>ආගම පිළිබඳ අතුරු කමිටුවේ තුන්වන විකල්පය</u>

> *ශ්‍රී ලංකා ජනරජය සියලු ම ආගම්වලට සම තත්ත්වයක් දිය යුතුය. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වැනි හා 14(1)ඉ ව්‍යවස්ථාවලින් සියලු ආගම්වලට ලබා දී ඇති අයිතීන් ආරක්ෂා කරමින් රාජ්‍ය බුද්ධාගම හා බුද්ධ ශාසනය පෝෂණය කර ආරක්ෂා කළ යුතු ය. (උපුල් අබේරත්න; එම්.එල්.ඒ. කාදර්; ලාල් විජේනායක; සිරිමසිරි හපුආරච්චි; සුනිල් ජයරත්න)*

මෙම යෝජනාව තවත් පියවරක් ඉදිරියට ගමන් කරමින් සියලු ආගම්වලට සම තත්ත්වයක් ලබා දිය යුතු ය යනුවෙන් පවසමින් බුද්ධාගම කෙරෙහි රාජ්‍යානුග්‍රහයද පවත්වා ගැනීමට යෝජනා කරයි.

<u>1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයට ඉදිරිපත් වූ ඇතැම් යෝජනා</u>

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයට ඉදිරිපත් වූ ඇතැම් යෝජනාවන්ද 2016 වසරේ ආගම පිළිබඳ අතුරු කමිටුවේ සඳහන් ඇතැම් යෝජනාවන්ට සමාන ස්වරයක් සහ භාෂාවක් යොදාගෙන ඇතැයි පෙනී යන බව ස්කොන්තාල් පවසයි.

ඒ අතරින් මා සිත්ගත් යෝජනාවක් වන්නේ (එක්සත් පෙරමුණේ පාර්ශ්වකාර පක්ෂයක් වූ) ප්‍රජාතාන්ත්‍රික කම්කරු සංගමය වෙනුවෙන් එහි නායකයා වූ ඒ. අසීස් මහතා ඉදිරිපත් කර තිබෙන යෝජනාවකි.

*ශ්‍රී ලංකා ජනරජයේ  බහුතරයේ ආගම වන බුදුදහමට නිසිතැන ලබාදිය යුතු ය. එහෙයින් හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි සහ අන් සියලු ආගම්වලට ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති මූලික අයිතිවාසිකම් තහවුරු කරමින් බුදුදහම සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුතු ය.*

*In the Republic of Sri Lanka, Budhhism, the religion of the majority of the people, Shall be given its rightfull place  and accordingly, it shall be the duty of the State to protect and foster Budhhism, while assuring to Hinduism, Islam, Christianity and all religions rights granted by basic resolution 5(4)*

මෙහි මෙන් ම එවක තවත් යෝජනාවලද භාවිත වූ නිසිතැන යනු යෙදුම නොපැහැදිලි වූ බැවින් පසු ව එය ප්‍රමුඛස්ථානය ලෙස නිශ්චය කරගන්නා ලදී. එය සහ 72 ට අනුරූප ව දක්වා ඇති මූලික අයිතිවාසිකම් ගැන සඳහන හැරුණු විට මෙය වත්මන් වගන්තියෙන් ප්‍රධාන වසයෙන් ම වෙනස් වන්නේ අයිතිවාසිකම් සුරක්ෂිත විය යුතු අනෙකුත් සියලු ම ආගම් ප්‍රකාශිත ව අන්ගතර්ගත කිරීම නිසා ය.

මේ තුළ ඔවුන්ගේ අයිතිවාසිකම්ද සුරක්ෂිත කිරීමට ව්‍යවස්ථාව පොරොන්දු වීම සහ තමන්ද ව්‍යවස්ථාව තුළ නියෝජනය වීමත් හේතුවෙන් හින්දු, මුස්ලිම් සහ ක්‍රිස්තියානි ආගම් අදහන ජනතාවට එක්තරා ආකාරයක අභිමානවත් සහ සුරක්ෂිත හැඟීමක් ඇතිකිරීමට ඉඩ ඇති බව අසීස් මහතා මෙම යෝජනාවට හේතු දක්වමින් පවසා ඇත.

මා ආදර්ශවත් වසයෙන් හඳුනාගත් මෙම යෝජනා අතරින් එක් යෝජනාවකින් ම වත්මන් නමවන වගන්තිය ප්‍රතිස්ථාපනය කළ යුතු යැයි මම නොකියමි. නමුත් මෙම ආදර්ශ යෝජනාවන් වෙතින් යම් ආභාෂයක් ලද හැකි ය. එම යෝජනාවන් විසින් අනෙකුත් ආගම් කෙරෙහි සුරක්ෂිත සහ අභිමානවත් තත්ත්වයක් ඇතිකිරීමට ගත් ප්‍රවේශයන්හි සංයෝගයක් යොදාගත හැකි ය. නිදසුන් වසයෙන් පහත දළ ප්‍රකාශය සැලකිය හැකි ය.

*ශ්‍රී ලංකා රජය බුදුදහම සහ බෞද්ධ සංස්කෘතිය විසින් කර ඇති ඓතිහාසික කාර්යභාරය සහ බෞද්ධ උරුමය පිළිගනිමින් සියලු ආගම් කෙරෙහි සමාන ව කටයුතු කරනු ලැබේ. ඒ අනුව බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, ඉස්ලාම් ඇතුලු සියලු ම ආගම්වලට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ උරුමයන් ආරක්ෂා කරදෙමින් එම සියලු ආගම් සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ කාර්යභාරය විය යුතු ය.*

## <u>බුද්ධ ශාසනය සුරක්ෂිත කිරීම සම්බන්ධ අවිනිශ්චිත තත්ත්වය දුරු කිරීම</u>

මෙහි දී බුද්ධශාසනය සුරක්ෂිත කර පෝෂණය කළ යුතු ය යන්න සම්බන්ධයෙන් භික්ෂු ජීවිතයේ ස්වාධීනත්වයත් විනය ආරක්ෂා කිරීමට රජයට ඇති වගකීමත් අතර ඝට්ඨනය නැති කිරීමට ඉන් අදහස් වන නැතිනම් රජයට ඒ පිණිස මැදිහත් විය හැකි ආකාරයන් සවිස්තර ව දැක්වීම යුතු ය. ඒ ප්‍රමාණය තීරණය කිරීම සංඝයා සතු තීරණයකි. පහත ආකාරයේ වැකියක් අමතර ව ඇතුළත් කිරීම සුදුසු ය.

බෞද්ධ පුරාවිද්‍යාත්මක සහ ආගමික සිද්ධස්ථානයන්ට අයත් භූමි රැකගැනීම සහ ඒවායේ බෞද්ධ පසුබිම සහ අනන්‍යතාවයට හානි වන ක්‍රියාකාරකම් වලින් වැළැක්වීම රජයේ වගකීමක් විය යුතු ය.

මෙවැනි වැකියක් විසින් භික්ෂු ස්වාධීනත්වය සම්බන්ධ ගැටලුව අහෝසි වනු ඇතැයි සිතමි. මන්දයත් බුදුදහම සුරක්ෂිත කිරීම හරහා බෞද්ධයන් අපේක්ෂා කරන දෙය ඍජු ව අදහස් කර ඇති බැවිනි. කෙසේනමුත් මෙවැනි වගන්තියක් යොදාගැනීම තුළ වෙනත් ගැටලුවක් උග්‍ර වනු ඇත. එනම් අනවශ්‍ය අවස්ථාවන්හි දීද මෙහි පිහිට පැතීමෙන් සමාජයේ නොසන්සුන්කාරී තත්ත්වයක් ඇති වීමයි. කෙසේනමුත් මුදුමහාවිහාරයයට සහ කූරගල සහ පානම්පත්තුවට අයත් ඓතිහාසික බෞද්ධ පුදබිම් මුස්ලිම් ජනාවාසයන්ට යට වී ඇති බව 2002 බුද්ධ ශාසනය පිලිබඳ ජනපති කොමිෂන් සභාව පවසන බැවින් මෙවැනි ප්‍රතිපාදනයක් ඇතුළත් කිරීමේ කාලීන අවශ්‍යතාවයක් ඇතැයි සිතමි.

කෙසේනමුත් ඉහත ආකාරයේ වැකියක් ඇතුළත් කරන්නේ නම් මෙවැනි ප්‍රතිපාදනයක් අමතර ව යෙදීම තුළින් යළිත් පෙර තත්ත්වය ම ඇති කළ හැකි බැවින් මෙකී අවශ්‍යතාවය සැපිරෙන පරිදි ඉහත අදර්ශ යෝජනාව ම ශක්තිමත් කිරීම කළ හැක.

නැතිනම් ඉහත දැක්වූ ආගම පිළිබඳ අතුරු කමිටුවේ තෙවන විකල්පයේ බුද්ධශාසනය සුරක්ෂිත කිරීම වෙනුවට මෙහි භාෂාවට සමීප භාෂාවක් යොදාගත හැකි ය.

- සචින්ත
මදූෂාන්